# සති පාසල සඳහා කාර්ය පත්‍රිකාව

1. *පංතිය - 13
   *විෂය - ගිණුම්කරණය
   *අදාළ සතිය - ඔක්තොම්බර් 4

2. පාඩම හෝ ඒකකය - 12.0 සීමාසහිත සමාගමක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි.
   12.3 සංචිත ප්‍රාග්ධනිත කිරීමේ හා හිමිකම් නිකුතුව සම්බන්ධ ගනුදෙනු ගිණුම්ගත කරයි.

3. ශිෂ්‍යයා කළ යුතු කාර්යයන්-

   1.සීමාසහිත සමාගමක කොටස් නිකුත් කිරීම සම්බන්ධ ව ඔබ දන්නා කරුණු මතකයට ගන්න.
   2.ඔබේ ප්‍රදේශයේ පිහිටි සීමාසහිත සමාගම හිමිකම් කොටස් පිළිබඳ විමසා බලන්න.
   3.ඊ තක්සලාව,ඊ නැණපියස,ගුරු ගෙදර,DP Education හෝ පාසල් වෙබ් අඩවි හෝ මුද්‍රිත පොත්පත් ආදී ඉගෙනුම් ආධාරක මගින් පාඩමට අදාළ ඉගැන්වීම්,පාඩම් ලබා ගෙන ඉගෙන ගන්න.
   4. හිමිකම් කොටස් නිකුත් කිරීමේ අරමුණු පිළිබඳව පොතපතින් කරුණු රැස් කරගන්න.
   5.සීමිත පොදු සමාගමක සංචිත යනු මොනවාදැයි වැඩිහිටියන් සමඟ සාකච්ඡා කරන්න.

4. ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කර ගත හැකි පොත්පත්,web site,LMS පාඩම් හා ඉගෙනුම් ආධාරක

   1. ඊ තක්සලාව - https://www.e-thaksalawa.moe.gov.lk/moodle/mod/hvp/view.php?id=41257

   2. ඊ නැණපියස - https://www.enenapiyasa.lk/lms/mod/resource/view.php?id=18649

   3. ගුරු ගෙදර - https://youtu.be/HkVQMSpW2IA

   4. වෙනත් - යූ ටියුබ් - https://www.youtube.com/watch?v=xwQ-GIpjCgI
      https://www.youtube.com/watch?v=_f9UAnhnrrI

https://www.youtube.com/watch?v=sxfkHvVHRO4

5. අතිරේක පොත්/සඟරා -

6. මෙම පාඩම තුළින් ලබා ගත හැකි ඉගෙනුම් ඵල -
    1. හිමිකම් කොටස් නිකුතුව පැහැදිලි කරයි.
    2. සංචිත ප්‍රාග්ධනිත කිරීම පැහැදිලි කරයි.
    3. හිමිකම් නිකුතුව හා සංචිත ප්‍රාග්ධනිත කිරීම අතර සමාන අසමානකම් දක්වයි.
    4. හිමිකම් හා සංචිත ප්‍රාග්ධනිත කිරීම් ගිණුම්ගත කරයි.

7. තක්සේරුව හා ඇගයීම -

සීමාසහිත ඇතුගල්පුර පොදු සමාගමේ 2020.01.01 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය (උද්ධෘතය)

| | | |
|---|---|---|
| | | රු.000 |
| **<u>ප්‍රකාශිත ප්‍රාග්ධනය</u>** | | |
| සාමාන්‍ය කොටස් (100,000) | | 4,000 |
| | | |
| **<u>සංචිත</u>** | | |
| ප්‍රත්‍යාගණන සංචිත | 1,000 | |
| පොදු සංචිතය | 500 | |
| රඳවා ගත් ඉපැයුම් | 2,000 | 3,500 |

2020.01.01 දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත තීරණ ගන්නා ලදී.

1. සමාගමේ දැනට තිබෙන සෑම සාමාන්‍ය කොටස් 4: 1 බැගින් රු.40 ක ප්‍රතිෂ්ඨාවකට රඳවාගත් ඉපැයුම් ප්‍රාග්ධනිත කිරීම.
2. සංචිත ප්‍රාග්ධනිත කිරීමට පෙර පැවති සෑම සාමාන්‍ය කොටස් 5:1 බැගින් රු.50ක ප්‍රතිෂ්ඨාවක් මත හිමිකම් කොටස් නිකුතුවක් කිරීම.

අවශ්‍ය වන්නේ,

1. ඉහත ගනුදෙනු හා සිද්ධිවලට අදාළ ජර්නල් සටහන් දැක්වීම.

2. ඉහත ගනුදෙනු හා සිද්ධි වාර්තා කිරීමට අවශ්‍ය ලෙජර් ගිණුම පිළියෙල කිරීම.
3. ඉහත ගනුදෙනු හා සිද්ධි වාර්තා කිරීමෙන් පසු මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ උද්ධෘතයන් දැක්වීම.

නිලධාරියාගේ නම -
පාසල/පිරිවෙන -